FMM SRI LANKA නිදහස් මාධ්‍ය ව්‍යාපාරය சுதந்திர ஊடக இயக்கம் Free Media Movement

මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
Media Freedom Rights Monitoring Report

MFRMD

2021 - කලාප අංක 01 - ජනවාරි

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව

Media Freedom Rights Monitor මාසික වාර්තාව යනු නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් 2021 වර්ෂයේ ජනවාරි මස සිට, මාසිකව නිකුත් කිරීමට බලාපොරොත්තු වන මාසික වාර්තා මාලාවේ පළමු වැන්න වේ. ඒ ඒ මාසය තුළ මාධ්‍ය නිදහසට බලපානු ලබන සිදුවීම් වාර්තා කිරීමක් සහ කෙටි නිරීක්ෂණයක් වාර්තාවට ඇතුළත් වේ.

Media Freedom Rights Monitor වාර්ෂික වාර්තාවක් ද නිකුත් කිරීමට නිදහස් මාධ්‍ය ව්‍යාපාරය බලාපොරොත්තු වේ. එමගින් මාධ්‍ය නිදහස කෙරෙහි බලපෑ විවිධ සාධක පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරනු ඇත. 2020 වර්ෂය සඳහා වන පළමු වාර්තාව 2021 මැයි 03 යෙදෙන ලෝක ජනමාධ්‍ය නිදහස් දිනයේදී නිකුත් කරනු ඇත.

මෙම වාර්තා සම්පාදනයේදී මාධ්‍ය නිදහස පිළිබඳව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුළු සිවිල් සංවිධාන විසින් කලින් කල නිකුත් කොට ඇති ප්‍රකාශනයන්, දේශීය සහ විදේශීය අධිකරණ තීන්දු සහ මාධ්‍ය නිදහස හා මානව අයිතිවාසිකම් පිළිබඳ ජගත් ප්‍රඥප්තීන්හි දක්වා ඇති දර්ශක උපයෝගී කොට ගැනේ.

මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට හා වැඩි දියුණු කර ගැනීමට ඔබගේ ප්‍රතිචාර වැදගත් වන හෙයින් පහත දැක්වෙන විද්‍යුත් ලිපිනයට ඒවා ලබා දෙන මෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් ඉල්ලා සිටිමි.

විද්‍යුත් ලිපිනයඃ fmm.mfrm@gmail.com

**සීතා රංජනී**
කැඳවුම්කරු

## හැඳින්වීම

2020 ඔක්තෝබර් මස 22 දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා ප්‍රජාතන්ත්‍රවාදයට ඇතිවන අභියෝග සම්බන්ධයෙන් ඇති වූ අදහස් හා මතවාදවල දිගුවක් 2021 ජනවාරි මාසය දක්වාද පැවතිණ. 20 වැනි සංශෝධනය හරහා ස්වාධීන කොමිසන් සභාවලට සාමාජිකයන් පත් කිරීම, විනිශ්චයකාරවරුන් ඇතුලු ඉහළ නිලධාරීන් පත් කිරීම ආදිය සම්බන්ධ බලය ජනාධිපතිවරයා අත පත්වීම හේතුවෙන් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ද එය අනියමින් බලපාන ආකාරය ගැන සැකය මාධ්‍ය ක්‍රියාකාරීන් අතර පැවතිණ. ඒ අනතුර ගැන අදහස් මාධ්‍ය හරහා ප්‍රකාශයට පත්වීම සිදු විය. ජනවාරි මාසය එළඹෙන්නේ එවැනි වාතාවරණයක් යටතේය.
මාධ්‍ය නිදහස සහ අයිතීන්වලට අදාලව මෙන්ම මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ අවධානයට ලක්විය යුතු ප්‍රධාන ප්‍රවණතාවයන් තුනක් ජනවාරි මාසය තුළ මාධ්‍ය ක්ෂේත්‍රය නිරීක්ෂණය කරන විට දක්නට ලැබිණ.

1. රජය විසින් සමාජ මාධ්‍ය පරිශීලකයන්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ අයි.සී.සී.පී.ආර් පනත භාවිතා කිරීම.
2. තාඩන පීඩනවලට ලක් වන ඇතැම් මාධ්‍යවේදීන් දේශපාලන බලපෑම් මත සිය ආරවුල් සමථයකට පත් කර ගැනීමට එකඟතාවය පළ කිරීම.
3. කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය අභියෝගයට ලක්වීම.

මාධ්‍ය නිදහස සහ අයිතීන් සම්බන්ධයෙන් මෙන්ම මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගේ අවධානයට ලක්වූ ඉහත ප්‍රවණතා තුනට අදාල සිදුවීම් 09ක් ජනවාරි මාසය තුළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිරීක්ෂණය කරන ලදී. එම සිදුවීම් මෙම මාසය තුළ අලුතින් උද්ගත වූ සිදුවීම් මෙන්ම ඊට පෙර සිදුවීම්වල නව වර්ධනයන්ද වෙයි. මෙයින් සමහර සිදුවීම් සම්බන්ධයෙන් වෙබ් අඩවි හෝ සමාජ මාධ්‍යවල වාර්තා වී තිබූ අතර සමහර සිදුවීම් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වූ ඒවා වෙයි. එයින් සිදුවීම් කිහිපයකට සමාජ මාධ්‍ය පළ කිරීමක් හෝ ප්‍රකාශනයක් පාදක වී තිබුණද අදහස් පළ කිරීමේ පිළිගත් හර පද්ධතීන් ඉක්මවා ගිය ඒවා හෝ වගකීම් සහගත නොවූ ඒවා ද බව සැලකිල්ලට ගැනීමට සිදු වෙයි.

එම සිදුවීම් සැකෙවින්,

1. ICCPR පනත යටතේ ව්‍යාපාරික තරුණයකු වන Fazl Muhammed Nizar අත්අඩංගුවට ගැනීම. ඔහු වෙබ් අඩවියකට ද ලියා ඇති ලේඛකයෙකි.
2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන සිටි දේශපාලන ක්‍රියාකාරිකයකු මෙන්ම නිදහස් මාධ්‍යවේදියකු වූ මුරුකාපිල්ලෙයි කෝකිල දාසන් තවදුරටත් අත්අඩංගුවේ තබා ගැනීම.
3. රාජ්‍ය අමාත්‍යවරයෙකු විසින් මව්බිම කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ මාධ්‍යවේදී සිසිර පරණතන්ත්‍රීට සහ මව්බිම මාධ්‍යවේදී ශිරාන් රණසිංහට තර්ජනය කිරීම.
4. පරිසර ක්‍රියාකාරී ලක්මාල් රණබාහුට පහරදීම
5. විකල්ප ධාරාවේ පැරණිම පුවත්පත වන රාවය පුවත්පතේ කතුවරයා වැඩ තහනමට ලක් කිරීම
6. ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කර වසර 11ක් ගතවීම නිමිත්තෙන් වෙබ් අඩවියක් ආරම්භ කිරීම.
7. ඝාතනයට, ප්‍රහාරවලට හා බලහත්කාරයෙන් අතුරුදන්කිරීමට ලක් කළ මාධ්‍යවේදීන් අනුස්මරණය කිරීමේ රැස්වීමක්
8. 'කළු ජනවාරියට' වසර 11ක් පිරීම නිමිත්තෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිවේදනයක් නිකුත් කිරීම හා 'ජනවාරිය තවම කළුයි' තේමාව යටතේ ෆෙස්බුක් ප්‍රචාරක ව්‍යාපාරයක් ජනවාරි 29 වැනි දින දියත් කිරීම.
9. යුරෝපීය සංගමය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම නැවත අවධාරණය කිරීම

## වාර්තා වූ සිදුවීම්

**1 වන වගුව: 2021 ජනවාරි**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍යවේදීන් ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 04 |
| 02 | මාධ්‍ය ස්වාධීනත්වය | 01 |
| 03 | නිතීමය ගැටලු | 04 |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව:

**මාධ්‍ය නිදහස සහතික වන්නේ මාධ්‍යවේදීන්ට තම වෘත්තීය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවයකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමට තිබෙන වටපිටාව තුළය. මෙම මූලික නිදහසට අභියෝග එල්ල වූ අවස්ථා හතරක් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ජනවාරි මාසය තුළ නිරීක්ෂණය කළේය.**

**2 වගුව: 2021 ජනවාරි: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත බව - සිදුවීම් 04**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පහර දීම් | 01 |
| 02 | අත්අඩංගුවට ගැනීම් | 02 |
| 03 | තර්ජනය කිරීම | 01 |

1. ව්‍යාපාරික තරුණයකු වූ Fazl Muhammed Nizar අත්අඩංගුවට ගැනීම.

ඔහු අත්අඩංගුවට ගෙන තිබුණේ 2007 අංක 56 දරන අයි.සී.සී.පී.ආර් පනත යටතේය.

සිය ෆෙස්බුක් ගිණුම ඔස්සේ ජාතීන් අතර සංහිඳියාව බිඳ දමන ආකාරයේ ප්‍රකාශ නිකුත් කළේය යන චෝදනාව මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශය විසින් Fazl Muhammed Nizar නමැත්තා 2020-01-12 වැනිදා අත්අඩංගුවට ගන්නා ලදී. ඔහු කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව, ප්‍රධාන මහේස්ත්‍රාත් මොහොමඩ් මිහාර් මහතා විසින් 2020-02-08 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය හමුවේ කරුණු දක්වමින් වාර්තා කර ඇත්තේ: මෙම සැකකරු ජාතීන් අතර සුහදතාවය බිඳ වැටෙන ආකාරයට භික්ෂූන් වහන්සේලා ඇතුළු විවිධ පාර්ශ්වවලට අපහාස වන ආකාරයෙන් විවිධ ප්‍රකාශ මුහුණුපොත හරහා නිකුත් කර තිබෙන බවය. මේ තුළින් ඔහු එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය පනත යටතේ වරදක් සිදු කර ඇති බව එම නිලධාරීන් අධිකරණයට වාර්තා කර ඇත.

මෙම පුද්ගලයා විසින් සෘජුවම ජනාධිපතිවරයා ආමන්ත්‍රණය කරමින් මුහුණු පොතට එක් කළ වීඩියෝවක් මෙම අත්අඩංගුවට ගැනීමට හේතු වී අතර, ජනාධිපතිවරයා අම්පාරේදී කළ ආන්දෝලනාත්මක ප්‍රකාශය එම වීඩියෝව මඟින් විවේචනයට ලක් කරයි. භික්ෂූන්වහන්සේලාට අසභ්‍ය වචනයෙන් බැණවදින ආකාරය එම කතාවේ අගභාගයේ ඇත.

දෙහිවල පදිංචිකරුවකු වන, වෘත්තියෙන් ව්‍යාපාරිකයෙකු වන Fazl Muhammed Nizar https://www.colombotelegraph.com වෙබ් අඩවියට ලිපි රැසක් ලියා ඇති ලේඛකයෙකි. 2014 මැයි 5 වැනිදා සිට 2018 අගෝස්තු 29 වැනිදා දක්වා කාලය තුළ ඔහු එම වෙබ් අඩවියට ලිපි 26ක් ලියා තිබේ. http://bit.ly/3oIlDVz

2. ත්‍රස්තවාදය මර්දනය කිරීමේ පනත යටතේ අත්අඩංගුවේ පසුවන මුරුකාපිල්ලෙයි කෝකිල දාසන් තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කර සිටීම.

   මුරුකාපිල්ලෙයි කෝකිල දාසන්, වාලච්චේන පදිංචි, මඩකලපුව ප්‍රදේශය පදනම් කරගෙන මාධ්‍යකරණයේ නිරත නිදහස් මාධ්‍යවේදියෙකි. දෙමළ ජාතික සන්ධානය සමඟ දේශපාලන ක්‍රියාකාරකම්වල යෙදෙන සහ 2018 වසරේ පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයෙකි. 2020-11-18 දින වාලච්චේන පොලිසිය මඟින් ඔහු අත්අඩංගුවට ගත් අතර ඊට හේතු වන්නේ ඔහු විසින් සිය ෆේස් බුක් ගිණුමේ පළ කළ 'මහවිරු' සැමරුම පාදක කරගත් සටහනක් සහ ඡායාරූප දෙකකි.. පොලිසිය චෝදනා කරන්නේ එම පෝස්ටුව මගින් එල්ටීටීඊ සංවිධානයේ අදහස් ප්‍රවර්ධනය කළ බවයි. ඒ අනුව ඔහු, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රකාරව නිකුත් කළ 29-08-2011 ගැසට් පත්‍රයේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට චෝදනා නඟා ඇත.

   ඔහුට ඇති චෝදනා අනුව ඇප ලබා ගත යුත්තේ මහාධිකරණයෙන් වන අතර ඒ වෙනුවෙන් නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා මඟින් නීතිපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත. කෝකිලදාසන්ට එරෙහි නඩුව 2020-01-25 වැනිදා වාලච්චේන මහේස්ත්‍රාත්වරයා හමුවේ කැඳවා තිබූ අතර තවත් දින 14කට රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. ඉදිරි නඩු දිනය පෙබරවාරි 8 වැනිදාය.

3. රාජ්‍ය අමාත්‍ය සරත් විරසේකර විසින් මව්බිම කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර පරණතන්ත්‍රිට සහ කැබිනට් අමාත්‍යවරයාගේ ලේකම් විසින් මව්බිම මාධ්‍යවේදී ශිරාන් රණසිංහට තර්ජනය කිරීම.

   මාධ්‍යවේදී සිසිර පරණතන්ත්‍රි, තමන්ට හා සිය පුවත්පතේ මාධ්‍යවේදියකු වන ශිරාන් රණසිංහට දුරකථනයෙන් එල්ල වූ තර්ජනයක් පිළිබඳව ජනවාරි 17වැනිදා කුරුඳුවත්ත පොලිසියට පැමිණිල්ලක් කර තිබේ.

   මහරගම නගර සංවර්ධන කටයුතුවලදී වෙළෙඳසැල් කඩා දැමීම සඳහා පොලිසිය යොදාගැනීම පිළිබඳ පුවතක් මව්බිම පුවත්පතේ පළ කිරීම සම්බන්ධයෙන් පොලිසිය භාර රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකරගේ ලේකම්වරයකු විසින් අදාළ පුවත ලියූ මාධ්‍යවේදී ශිරාන් රණසිංහටත්, අමාත්‍යවරයා විසින් මව්බිම කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර පරණතන්ත්‍රිටත් දුරකථනයෙන් බැණ වැදී තර්ජනය කළේ යැයි theleader.lk වෙබ් අඩවිය වාර්තා කර තිබිණි. https://theleader.lk/news/5542-2021-01-19-16-40-03

   එහෙත් මව්බිම පුවත්පත මේ තර්ජන සම්බන්ධ කිසිවක් වාර්තා කර නොතිබිණි. මව්බිම කර්තෘ බෙනට් රූපසිංහගෙන් කළ විමසීමේදී එවැනි පැමිණිල්ලක් කර ඇති බව පිළිගත් අතර වැඩිදුර තොරතුරු කීම ප්‍රතික්ෂේප කළේය. පසුව දැනගන්නට ලැබුණේ කිසියම් එකඟතාවක් මත අදාළ පැමිණිල්ල ඉදිරියට ගෙන නොයෑමට තීරණය කර ඇති බවයි.

4. පරිසර ක්‍රියාකාරී ලක්මාල් රණබාහුට පහරදීම:

   2021-01-24 වැනිදා කලවානේදී, නිදහස් මාධ්‍යවේදියකු හා පරිසර ක්‍රියාකාරිකයකු වන ලක්මාල් රණබාහුට පිරිසක් දරුණු ලෙස පහරදී ඇත. මෙම ප්‍රහාරයෙන් ඔහුගේ අතක් බිඳී, මුහුණට හා ශරීරයට තුවාල සිදු වී ඇති අතර ඔහු දින කිහිපයක් රත්නපුර රෝහලේ ප්‍රතිකාර ලැබීය.

   ඔහු වෙබ් අඩවියකට ලියන නිදහස් මාධ්‍යවේදිකයකු බව ප්‍රකාශිත නමුත් ප්‍රහාරයට ලක්වී ඇත්තේ වාර්තාකරණයක් හේතුවෙන් නොව පුරවැසියන්ට බලපාන පරිසර හානියක් පිළිබඳව කලවාන ප්‍රාදේශීය ලේකම්වරියට පැමිණිලි කොට ආපසු පැමිණෙමින් සිටියදීය. අදාල ප්‍රාදේශීය ලේකම්වරියගේ සැමියා ඇතුළු පිරිසක් විසින් මෙම පහරදීම සිදු කර ඇති බවට ඔහු විසින් කලවාන පොලිසියට පැමිණිලි කර තිබේ. පහරදීමට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගෙන පොලිස් ඇප මත මුදාහැර ඇති අතර තවමත් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නැත.

## මාධ්‍ය හිමිකාරීත්වය:

**මාධ්‍ය හිමිකාරීත්වය මාධ්‍ය නිදහසට සෘජුව බලපාන සාධකයකි. ප්‍රාග්ධන ගැටලු, කළමනාකරණ සහ පරිපාලන තීන්දු යනාදියද මාධ්‍ය නිදහසට සෘජුව බලපායි.**

**3 වගුව: 2021 ජනවාරි: මාධ්‍ය ස්වාධීනත්වය - සිදුවීම් 03**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍ය හිමිකාරීත්වය සහ මාධ්‍ය නිදහස | 01 |

1. රාවය කතුවරයා වැඩ තහනමට ලක් කිරීම:

රාවය පුවත්පතේ ප්‍රධාන කර්තෘ විමලනාත් වීරරත්නගේ සේවය අත්හිටුවන බව ආයතනයේ සභාපති වික්ටර් අයිවන් විසින් ජනවාරි 31 වැනිදා දැනුම් දී ඇති බව වාර්තා වෙයි. පුවත්පත තාවකාලිකව නතර කරන ලෙස සභාපතිවරයා විසින් දෙන ලද දැනුම්දීමට පටහැනිව තවදුරටත් පුවත්පත පවත්වාගෙන යෑම එයට හේතුව බව ජනවාරි 31 වැනිද වනවිට පැවති තත්ත්වයයි.

---

## නිතීමය ගැටලු:

**මාධ්‍යවේදීන්ට එරෙහිව සිදුවන අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුවිය යුතුවා සේම, සැකකරුවන් හඳුනා ගත හොත් නඩු විභාග ආරම්භ විය යුතුය. අධිකරණය අපක්ෂපාතීව ක්‍රියාත්මක වීම සිදු විය යුතුතේ එහිදීය. ශ්‍රී ලංකාව මෙන්ම බොහෝ රටවල් මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වැරදිකරුවන්ට දඩුවම් ලබා දීම් සිදු කරන්නේ නැත. උදාහරණයක් ලෙස මාධ්‍යවේදියකු ඝාතනය කිරීම හෝ බරපතල අපරාධයක් සිදු කිරීම ගැන පරීක්ෂණ සිදු නොවන අතර එනිසාම නීති කටයුතු සිදු නොවෙයි. නීති කටයුතු ඉදිරියට නොයන හෙයින් එහි අවසානයේ එම අපරාධය සිදු කළ අයට දඩුවම් හිමි නොවෙයි. දඩුවමින් නිදහස් වී සිටීමට හැකි වීම මගින් බිය සහිත වාතාවරණය වර්ධනය වීම මෙන්ම, එමගින් ස්වයං වාරණය ද වර්ධනය විය හැකිය.**

**4 වගුව: 2021 ජනවාරි: නීතිමය ගැටලු - සිදුවීම් 04**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජනමාධ්‍යවේදීන් සම්බන්ධ සිදුවීම්වලදී දණ්ඩමුක්තිය පවත්වාගෙන යෑම | 01 |
| 02 | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම | 02 |

1. කළු ජනවාරි සැමරුම වෙනුවෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයෙන් නිවේදනයක් සහ ෆේස්බුක් ප්‍රචාරක ව්‍යාපාරයක්.

   ජනමාධ්‍යයට එරෙහිව සිදු කළ අපරාධ සම්බන්ධයෙන් යුක්තිය ඉල්ලා සිටින 'කළු ජනවාරිය'ට වසර 11ක් ගත වී ඇති බව සිහිපත් කරමින් නිවේදනයක් නිකුත් කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, 'පරම්පරා ගණනාවක් යනතුරු හෝ ඒ බලපෑම් සිදු කරමින් අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙනැවිත් ජනමාධ්‍යවේදීන්ට යුක්තිය ඉටු කර දීමට කටයුතු කරන මෙන්' මාධ්‍ය සමාජයෙන් මෙන්ම සියලු පුරවැසියන්ගෙන්ද ඉල්ලා සිටිමින් ජනවාරි 29 වැනිදා නිවේදනය නිකුත් කළ ඇත.

එදිනම නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ෆේස්බුක් පිටුව හරහා 'ජනවාරිය තවම කළුයි. යුක්තිය උදෙසා එක් වෙමු' නමින් ෆෙස්බුක් කණ්ඩායමක් ගොඩ නැගූ අතර එමඟින් අපරාධවලට ගොදුරු වූ මාධ්‍යවේදීන්ට යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා බලපෑම් කරන පෝස්ට් පළ කිරීමට ඉල්ලීමක් කොට එය ක්‍රියාත්මක කරන ලදී.

2. යුරෝපීය සංගමය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන මෙන් රජයෙන් ඉල්ලා සිටීම: ජනවාරි 25 ශ්‍රී ලංකා රජය සහ යුරෝපීය සංගමය අතර වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැත්වූ 23 ඒකාබද්ධ රැස්වීමේදී ශ්‍රී ලංකා රජය GSP+ යෝජනා ක්‍රමය යටතට ගැනෙන ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කොට තිබෙන අන්තර්ජාතික ප්‍රඥප්තීන් 23 ක් සම්බන්ධයෙන් සිය වගකීම නැවත අවධාරණය කරන ලදී. මේ සම්බන්ධයෙන් සිය ප්‍රතිචාරය දැක්වූ යුරෝපීය සංගමය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය නැවත අවධාරණය කරන ලද බව වාර්තා විය.

   මෙවැනි අවධාරණයක් මාධ්‍ය ප්‍රජාව වෙත වැදගත් වන්නේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ මාධ්‍ය නිදහස මර්දනය කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදාගත් අතීත අත්දැකීම් ඇති නිසාය. උද්ඝෝෂණ ව්‍යාපාරය දියත් කරමින්, පෝස්ටර් ප්‍රචාරක ව්‍යාපාර දියත් කරමින් හා නිවේදන නිකුත් කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද එවන් වකවානුවල මෙම පනත අහෝසි කරන ලෙස ඉල්ලා බලපෑම් කර ඇත.

3. ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කර වසර 11ක් ගතවීම නිමිත්තෙන් වෙබ් අඩවියක් ආරම්භ කිරීම.

   මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් යුක්තිය ඉටු නොවී එකොළොස් වසරක් ගතවීම නිමිති කොට www.ekneligodaforum.org නමින් වෙබ් අඩවියක් ජනවාරි 25 වැනිදා ආරම්භ කෙරිණි. "එක්නැලිගොඩ සංසදය" මෙම කටයුත්ත සංවිධානය කළේය.

4. ඝාතනයට, ප්‍රහාරවලට හා බලහත්කාරයෙන් අතුරුදන්වීමට ලක් වූ මාධ්‍යවේදීන් අනුස්මරණය කිරීමේ රැස්වීමක් ජනවාරි 16 වැනිදා කොළඹ ජානකී හෝටලයේදී පැවැත්විණි. 'සාධාරණ සමාජයක් උදෙසා මාධ්‍යවේදියෝ' සංවිධානය විසින් මෙම රැස්වීම සංවිධානය කරන ලදී.

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ට ද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය,දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවන් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙළ කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩි දුර තොරතුරු සොයා එමසිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරැම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25